**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**සති පාසල පුනරීක්ෂණ පාඨමාලාව**

බෞද්ධ ශිෂ්ටාචාරය

සතිය - 03

12 ශ්‍රේණිය

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර

**(සතිමත්බව තුළින් යහපැවැත්ම උදෙසා)** **(කාලය - පැය 1යි)**

01. නිපුණතාවඃ-

ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන ආගමික, සාමාජික, දේශපාලනික හා ආර්ථික පසුබිම විමර්ශනාත්මකව දකියි.

1.3. නිපුණතා මට්ටමඃ-

බුද්ධකාලීන භාරතීය දේශපාලන ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය ගවේශණය කරයි.

- ඉගෙනුම් ඵලඃ-
  - බුද්ධකාලීන භාරතීය දේශපාලන පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගනියි.
  - රාජාන්ඩු හා සමූහාන්ඩු ක්‍රමවල සාධනීය ලක්ෂණ මෙන්ම ගැටලු ද අවබෝධ කර ගැනීමට පෙළඹෙයි.
  - පාලකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.
  - පරිපාලන කටයුතුවල දී නොගැටී ක්‍රියාකරයි.

---

**විෂය අන්තර්ගතයට අදාළ පෙරහුරු පරීක්ෂණය**

(ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න)

01. i. බුද්ධකාලීන භාරතයෙ හි පැවති රාජාන්ඩු පාලන ක්‍රම සතර නම්කරන්න. (ල. 02)

ii. සමූහාණ්ඩු පාලන ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

iii. රාජාන්ඩු පාලන ක්‍රමය සහ සමූහාන්ඩු පාලන ක්‍රමය අතර පවතින ලක්ෂණ සාකච්ඡා කරන්න. (ල. 04)

iv. සොළොස් මහ ජනපදවල ප්‍රභවය සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ල. 05)

v. බුද්ධකාලීන භාරතීය පාලකයන් හා බුදුරජාණන් වහන්සේ අතර පැවති සම්බන්ධතාව උදාහරන තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)

02. i. බුද්ධ කාලීන භාරතීය දේශපාලන ව්‍යුහය තුළ පැවති මත්ස න්‍යාය සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

ii. රාජාණ්ඩුපාලන ක්‍රමය උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ල. 03)

iii. මහා රාජ්‍ය, එහි පාලකයන් හා අගනගර වෙන් වෙන්ව ලියා දක්වන්න. (ල. 04)

vi. සොලොස් මහා ජනපද හා ඒ සඳහා වර්තමානයේ භාවිත කරන නම සොයා තම සටහන් පොතෙ හි සටහන් කරන්න. (ල. 05)

v. සොලොස් මහ ජනපදවල බුදු දහම ව්‍යාප්තව පැවති බවට පිළිගත හැකි සාධක උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 06)